# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2456/33 - 2025 සැප්තැම්බර් මස 30 වැනි අඟහරුවාදා - 2025.09.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : කඩු/ඉඩම්/01/144/WS.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව රජය වෙත පැවරී ඇති බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*රජයට පැවරී ඇති ඉඩමේ/පරවශතාවේ විස්තර :-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 474/ඒ රග්ගහවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රග්ගහවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති ක.සි. අංක 522011 හා 2025.06.18 දින දරන කඩඉම් සිතියමේ, කලාප 01, පත්‍ර අංක 01 හි කැබලි අංක 01 ලෙස පෙන්නුම් කරන පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල:

**කැබලි අංක 01**

ඉඩමේ නම: දිසාවත්ත *නොහොත්* කටුගම්පලයාඹිවිට ගොඩැල්ලවත්ත, රග්ගහවත්ත *නොහොත්* තිඹිරිගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් හා තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: මංජුල පලිහේන මයා, පී.ඩී. නාලක පලිහේන මයා, ශ්‍යාමලී පලිහේන මිය; ප්‍රමාණය: හෙක්. 0.5514.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ. ව. 09.30 ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 ඔක්තෝබර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. හිමිකම් පෑමට සහාය වන සියලුම ඔප්පු හා ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

**එච්. එස්. සම්පත් ඉඩම්ගොඩගේ,**
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2025 සැප්තැම්බර් මස 30 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0270


1A - G 045474 - 15 (2025/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DIVPP/LAND/LA/ACQUI/3-2/334/15.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/10/2019/MV/465-I.

අංක 2304/42 හා 2022.11.02 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයෙහි ඉඩම් විස්තරයෙහි 18A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද දැන්වීමෙහි කැබලි අංක 228 හි ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් “0.0211” යන්න හෙක්ටයාර් “0.1804” ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩී. එම්. එස්. දසනායක,**
ප්‍රාදේශීය ලේකම්,
පොල්පිතිගම.

2025 සැප්තැම්බර් මස 16 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0273

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.